ටැස්මේනියානු ව්‍යාඝ්‍රයාට යළි පණ දෙයි

ටැස්මේනියානු ව්‍යාඝ්‍රයා යනු අපගේ ඇස් පනාපිටම වඳ වී ගිය සත්වයෙකි. අවසන් ටැස්මේනියානු ව්‍යාඝ්‍රයා මියගියේ 1936 දීය. මියයනවිට මේ සත්වයා හිටියේ සත්වෝද්‍යානයක කුඩා කුඩුවක් තුළය. මිහිමතින් තුරන් වී, වසර 85 කට පසු විද්‍යාඥයෝ කණ්ඩායමක් ටැස්මේනියානු ව්‍යාඝ්‍රයාට පණදීමට සූදානම් වෙති.

ටැස්මේනියානු ව්‍යාඝ්‍රයා යන පොදු නාමයෙන් හැඳින්වුවත් මෙම සත්වයාගේ නම තයිලැසයින්ය. මෙම සත්වයා සුනඛ පවුලේ සාමාජිකයෙකි. ව්‍යාඝ්‍රයකුගේ මෙන් ඉර ඇති බැවින්, තයිලැසයින් ට ටැස්මේනියානු ව්‍යාඝ්‍රයා යන නම පට බැඳුණි.

ශතවර්ෂයකට ආසන්න කාලයක් තිස්සේ ලොවට අහිමි තයිලැසයින් ට පණ දීමට සූදානම් වන්නේ ඇමෙරිකන් සහ ඕස්ට්‍රේලියානු විද්‍යාඥයන් කණ්ඩායමකි. එම වැඩපිළිවෙළ හැඳින්වෙන්නේ තයිලැසයින් ඉන්ටග්‍රේටඩ් ජෙනෙටික් රෙස්ටොරේෂන් රිසර්ච්' යනුවෙනි. මෙය ඩොලර් මිලියන ගණනක මහා ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියට මුදල් යොදවන්නේ 'ජෙනටික් ඉන්ජිනියරිං' සමාගමය.

විද්‍යාඥයන් මේ කරන්න සැරැසෙන්නේ, ජුරාසික් පාක්, ජුරාසික් වර්ල්ඩ් ඩයිනසෝරයන්ට පණ දුන්නා හා සමාන දෙයක් යැයි ඔබට සිතේවි. ඩයිනසෝරයන්ට පණ දීම සිදුවිය හැක්කේ චිත්‍රපටවලින් පමණි. හේතුව ඩයිනසෝරයන්ගේ ජෙනෝම (ජානමය ද්‍රව්‍ය) ගැන විද්‍යාඥයන් කිසිවක් දන්නේ නැත. ඩයිනසෝරයන්ගේ හැඩරුව සහ ස්වරූපය දැනගත්තේ පොසිල අස්ථිවලින් පමණි. ඒ වගේම ඩයිනසෝරයන් අපට පණපිටින් සිටිනු දකින්න ලැබී නැත. ඒත් තයිලැසයින්ගේ කතාව ඊට වෙනස්ය.

තයිලැසයින් ටැස්මේනියාවේ ජීවත් වූ සතෙකි. ක්ෂීරපායියෙකි. විද්‍යාඥයන් උත්සාහ ගන්නේ තයිලැසයින්ට යළි පණ දී, යළි ටැස්මේනියාවට ඌ හඳුන්වා දීමය. එසේ කරනු ඇත්තේ නව තාක්ෂණය සහ ජාන තාක්ෂණයේ පිහිටෙනි. අපගේ ඇස් පනාපිටම වඳ වී ගිය සතුන්ට යළි පණ දීමේ ඩී එක්ස්ටින්ක්ෂන්' ව්‍යාපෘති කීපයක් මේ වනවිට ක්‍රියාත්මක වී තිබේ. ඒ අතරට එක්වන අලුත්ම ව්‍යාපෘතිය තයිලැසයින් ට පණදීම යැයි විදෙස් මාධ්‍ය පැහැදිලි කරයි.

සරලව පැහැදිලි කළොත්, තයිලැසයින්ගේ ජෙනෝම (ජානමය ද්‍රව්‍ය) ප්‍රතිනිර්මාණය කිරීමට විද්‍යාඥයන්ට හැකියාව ලැබී තිබේ. ඒ, විද්‍යාඥයන් විසින් දශක ගණනාවක් පුරා එක් රැස් කර ගනු ලැබූ ජාන සංස්කරණයෙනි. ටැස්මේනියානු ව්‍යාඝ්‍රයාට සමාන ජාන ඇති ඩනාට් නමැති මීයන්ගේ ප්‍රාථමික සෛල (කඳ සෛල), තයිලැසීන් සෛල බවට පත් කිරීමට විද්‍යාඥයෝ උත්සාහ කරති. ටැස්මේනියානු ව්‍යාඝ්‍රයා ක්ලෝන ක්‍රමයට බිහිවනු ඇත්තේ ඒ අනුවය. එසේ උපත ලබන තයිලැසයින්, සියයට සියයක්ම වඳ වී ගිය තයිලැසයින් ට සමාන නොවනු ඇත. හේතුව විද්‍යාඥයන් ඩනාට් ඌරු මීයන්ගේ ජානමය ව්‍යුහය මූලික සැකිල්ල ලෙස යොදා ගන්නා බැවිනි.

ලුසිත ජයමාන්න

('ලයිව් සයන්ස්' ඇසුරිනි)